# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.20 පැය 0630 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1916/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

### 01. කුඩු මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.10.19 වන දින දහවල් කාලයේ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සිරිමුතු උයන නිවාස සංකීර්ණය ආසන්නයේදී වැටලීමක් සිදුකර කුඩු කිලෝ 09 ග්‍රෑම් 555 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 27 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. ගෙවල් බිඳ දේපල සොරකම් කළ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - තඹුත්තේගම පොලිස් ස්ථානය.

2025.10.13 වන දින තඹුත්තේගම පොලිස් ස්ථානයට වාර්තා වි තිබූ නිවසක් බිඳ රුපියල් ලක්ෂ 10 ක් පමණ වටිනා මුදල් හා රන් භාණ්ඩ සොරකම් කිරීමේ අපරාධයක් සම්බන්ධයෙන් තඹුත්තේගම පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2025.10.19 වන දින දහවල් කාලයේ රාජාංගනය යාය 01 ප්‍රදේශයේදී මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු සොරාගත් රන් භාණ්ඩ උකස් කර ලබා ගත් රිසිට්පත් 02 ක්, සොරාගන්නා ලද මුදලින් මිලදී ගත් රූපවාහිනී යන්ත්‍රයක් හා ජංගම දුරකථනයක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 21, 33 හා 54 යන වයස්වල පසුවන රාජාංගනය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

තඹුත්තේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - නිකවැරටිය පොලිස් වසම.

2025.10.19 වන දින නිකවැරටිය පොලිස් වසමේ පින්නපොලේගම ප්‍රදේශයේදී නිකවැරටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත

වැටලීමක් සිදු කර පුද්ගලික ඉඩමක් තුල පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 20, 32 හා 51 යන වයස්වල පසුවන නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

නිකවැරටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - මුන්දලම පොලිස් වසම.

2025.10.19 වන දින දහවල් කාලයේ මුන්දලම පොලිස් වසමේ බත්තුළුඔය ප්‍රදේශයේදී ඉස්සන් ගොවිපොළක ජල ටැංකියකට වැටීණු පුද්ගලයෙකු මුන්දලම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට ලද පැමිණිල්ලක් මත මුන්දලම පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය පුද්ගලයා අපස්මාර රෝගී තත්වයෙන් ජල ටැංකියට වැටී ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වි ඇත. මුන්දලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - නාල්ල පොලිස් වසම.

2025.10.19 වන දින උදෑසන කාලයේ නාල්ල පොලිස් වසමේ කොළඹ කුරුණෑගල මාර්ගයේ දොරොව්ව ප්‍රදේශයේදී ගිරිඋල්ල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක රියදුරුට නින්දයාම හේතුවෙන් මාර්ගයේ දකුණු පසට ඇදී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ටිපර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලබූ ත්‍රීරෝද රථයේ රියදුරු, එහි පසුපස අසුනේ ගමන් ගත් රියදුරුගේ බිරිඳ, දරු දෙදෙනා සහ තවත් කාන්තාවක් දඹදෙණිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 59 ක් වූ අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය දඹදෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර නාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - අවිස්සාවේල්ල පොලිස් වසම.

2025.10.19 වන දින උදෑසන කාලයේ අවිස්සාවේල්ල පොලිස් වසමේ කොළඹ මඩකලපුව ප්‍රධාන මාර්ගයේ දෙහිගහපිටිය ප්‍රදේශයේදී රත්නපුර දෙසට ධාවනය වූ ලොරි රථයක් වෙනත් වාහනයක් ඉස්සර කිරීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් මාර්ගයේ ලිස්සා ගොස් පෙරළී ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පසු පැදිකාරිය ලොරි රථයට යටවීමෙන් බරපතල තුවාල ලබා අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 22 ක් වූ පරකඩුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**